# පුරප්පාඩු

## අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය

## ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO)

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ පවතින, පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අධ්‍යක්ෂ - තාක්ෂණික - තනතුරු - HM 1-3 (පාරිසරික අංශය) - (තනතුරු 01 යි)**

පාරිසරික අංශය විසින් කර්මාන්ත වලට සංවර්ධිත ආයතනවලට සහ රජයේ ව්‍යාපෘති සඳහා සිය නෛතික බැඳීම් සපුරාලීමට සහ පාරිසරික රෙගුලාසිවලට අනුගත වීම් සඳහා සහ එම රෙගුලාසි හා අනුකූලව ක්‍රියා කිරීම සඳහා, උදව් උපකාර සහය ලබා දීම සඳහා පාරිසරික අධීක්ෂණ හා උපදේශක සේවා විස්තීර්ණ හා පුළුල් පෙළක් සපයනු ලැබේ.

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඉංජිනේරු ශිල්පය / විද්‍යාව / තාක්ෂණවේදය පිළිබඳ ප්‍රථම උපාධියක්

සහ

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters - ඉහළ) හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආයතනික සාමාජිකත්වය (IESL) හෝ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනයේ (SLIA) හි ආශ්‍රිත සාමාජිකත්වය (IESL හෝ SLIA හි පූර්ණ සාමාජිකත්වය)

සහ

රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක "කළමනාකරණ මට්ටමේ" අවම වශයෙන් වසර 15 (පහළොවක) පළපුරුද්ද

හෝ

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තීයවේදී ආයතනයක පූර්ණ සාමාජිකත්වය

සහ

රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :**

කළමනාකරණ කාණ්ඩයේ (MM) 1 ශ්‍රේණියේ, තනතුරක අවම වශයෙන් වසර 05 (පහක) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

හෝ

අධ්‍යයන / ශාස්ත්‍රාලීය / පර්යේෂණ කටයුතු කාණ්ඩය (AR - 2) තනතුරක අවම වශයෙන් වසර 05 (පහක) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

පාරිසරික කළමනාකරණයට අදාළ විෂය ක්ෂේත්‍රයක පළපුරුද්ද සහිත වීම අමතර වාසියක් වනු ඇත.

**පොදු කොන්දේසි :**

| | | |
|---|---|---|
| **වැටුප් පරිමාණය** | : | HM 1-3 රු. (86,865-15x2,270-120,915) |
| **වැටුප් තලය / පියවර** | : | රු. 86,865/- |
| **වයස් සීමාව** | : | වයස අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. |

**අධ්‍යක්ෂක (පරිපාලන) තනතුර - (HM 1-3) (කොන්ත්‍රාත්තු පදනම මත) - (තනතුරු 01 යි)**

බඳවා ගැනීම මුලිකව 6 (හය) මසක කාලයක් සඳහා වන අතර, එක් වසරක (01) කාල සීමාවකට දීර්ඝ කර ගැනීමේ හැකියාවද ඇත.

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය, මානව සම්පත් කළමනාකරණය හෝ අදාළ විෂය ක්ෂේත්‍රයක විද්‍යාවේදී (විශේෂ) උපාධියක් සමත් වී සිටීම

සහ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබාගත් කළමනාකරණ, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය, මානව සම්පත් පරිපාලනය හෝ අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධි සුදුසුකම් (Masters - ඉහළ) පශ්චාත් උපාධියක් ලබා තිබීම

සහ

රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක "කළමනාකරණ මට්ටමේ" අවම වශයෙන් වසර 15 (පහළොවක) පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද (සුදුසුකම් ලැබීමෙන් පසු ලත්)

**පොදු කොන්දේසි හා නියමයන් :**

| | | |
|---|---|---|
| **වැටුප් තලය** | : | HM 1-3 86,865.00 |
| **වයස් සීමාව** | : | වයස අවුරුදු 35 ට නොඅඩු සහ 65 ට නොවැඩි විය යුතුය. |

**වෙනත් ප්‍රතිලාභ :**

- ජීවන වියදම් දීමනාව
- සංවිධානය (NBRO) විසින් දායකත්වය දක්වනු ලබන සේවක අර්ථ සාධක අරමුදලට (EPF) 12% ක දායකත්වයට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට (ETF) 3% ක දායකත්වයට හිමිකම් ඇත.
- රජය සහ ආයතනයේ මණ්ඩලය විසින් පිරිනමනු ලබන වෙනත් ප්‍රතිලාභ
- සම්මත රජයේ ක්‍රියාපටිපාටිවලට අනුකූලව තෝරා ගනු ලබන අපේක්ෂකයා හට ප්‍රධානත පහසුකම්වලට හිමිකම් ලැබෙනු ඇත.

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනටමත් සේවයේ නියුතු සේවක සේවිකාවන් අයදුම්පත් සිය අදාළ දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත්වල මුද්‍රිත පිටපත අදාළ සහතික පත්වල පිටපත් සමග සම්පූර්ණ ජීව දත්ත තොරතුරු සහිතව info@nbro.gov.lk (වෙබ් අඩවිය) වෙත යොමු කළ යුතු වන අතර, එහි දෘඩපිටපත අයදුම් කරන තනතුර, ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කර ලේඛනගත තැපෑලෙන් පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ 2020 නොවැම්බර් මස 20 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය,**
**99/1, ජාවත්ත පාර, කොළඹ 05.**
**2020.10.26 වන දින**